සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# සිසු සවිය 2022
## 05 වන ශ්‍රේණියේ දූ පුතුන්ට අත්වැලක්

5

**පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය**
**සබරගමු පළාත**

**I පත්‍රය** | පැය 01

විභාග අංකය : ……………………………………………………………………

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි....**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

| | |
|---|---|
| I පත්‍රය ලකුණු | : |
| II පත්‍රය ලකුණු | : |
| මුළු ලකුණු | : |

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වන පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම ලියන්න.
* පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
* පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක් අඳින්න.**

# විශේෂ අවධානය පිණිස ...

පාසල්වල විදුහල්පතිවරු පංතිභාර ගුරු මහත්ම/මහත්මීන් වෙත...

- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රණයකොට හෝ පිටපත් කර 2022 මැයි මස 20 හෝ පහසු දිනක ඔබ පාසලේ 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සෑම දරුවෙකුටම ප්‍රශ්න පත්‍රය ලබා දීමට කටයුතු කරන්න.
- ගැටලුවක් ඇතොත් කොට්ඨාසයේ ප්‍රාථමික ගුරු උපදේශක, කලාප විෂය අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශය අමතන්න.
- පිළිතුරු පත්‍රය කලාප කාර්යාලය මගින් ඔබට ලබාගත හැකිය.
- වෙනත් පළාතක, කලාපයක දරුවෙකුට වුවද මෙය ලබාදීමට කටයුතු කරන්න.
- මේ සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය**

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන ආකෘතියට අනුව ලකුණු විශ්ලේෂණ වාර්තා සකස් කළ යුතුය.

- 2022 මැයි මස 20 වැනි දින පාසලේදී පිළිතුරු ලිවීම සඳහා

| I පත්‍රය | II පත්‍රය |
|---|---|
| පැය 01 යි | පැය 01 යි මිනිත්තු 15 යි |

- ලකුණු විශ්ලේෂණ වාර්තා අනුව දරුවන් සඳහා ප්‍රතිපෝෂණ සිදුකළ යුතුය.
- මෙදිනට කිරීමට අපහසුවන දරුවන් සඳහා ද මෙය පසු දිනක කළ හැකි බව ද දන්වමි.
- ඉතාමත් සතුටින් හා විනෝදයෙන් මෙම ප්‍රශ්න පත්‍රය ලිවීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය**

01. පහත රූප අතරින් වෙනස් රූපය තෝරන්න.

1. 

2. 

3. 

02. එකම කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ම සුදුසු දෙක මොනවා ද?


A


B


C


D

1. AB සහ CD
2. AC සහ BD
3. BC සහ AD

03. පහත රූපවලින් ඒවා අතර ඇති සම්බන්ධතාවය මත හොඳම සම්බන්ධතාව මත කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ආකාරය කුමක් ද?













1. AB සහ CD
2. AD සහ BC
3. AC සහ BD

04. කොටුව තුළ ඇති රූපය සකස් කර ගැනීම සඳහා ඒ අයුරින්ම යොදා ගත යුතු රූප දෙක මොනවා ද?




**A**


**B**


**C**


**D**

1. A සහ B
2. B සහ D
3. B සහ C

05. පහත දැක්වෙන්නේ රුපියලේ , රුපියල් දෙකේ සහ රුපියල් පහේ කාසි තුන බැගින් තබා ඇති ගොඩවල් තුනකි.




එක් ගොඩකින් එක් කාසියක් ද තවත් ගොඩකින් කාසි දෙකක් ද අනෙක් ගොඩින් කාසි තුනක් ද ගෙන සෑදිය හැකි වැඩි ම මුදල කීය ද?

1. රුපියල් 12     2. රුපියල් 17     3. රුපියල් 20

✷ **දී ඇති දෑ අතුරෙන් තුනක් එක් කාණ්ඩයකටත් දෙකක් තවත් කාණ්ඩයකටත් වන සේ ඒවා කාණ්ඩ කළ හැකි ය. දෙකක් ඇති කාණ්ඩයට අයත් වන්නේ මොනවා ද?**

06. පත්තරය , පාසල , සඟරාව, පුස්තකාලය, පොත

1. පාසල හා පොත
2. පොත හා පුස්තකාලය
3. පුස්තකාලය හා පාසල

07. අඹ, කැවුම්, අන්නාසි , කිරිබත්, කෙසෙල්

1. කිරිබත් හා කෙසෙල්     2. කෙසෙල් හා කැවුම්     3. කැවුම් හා කිරිබත්

08. රටාව අනුව ? ලකුණට ගැළපෙන රූපය කුමක් ද?




1. 

2. 

3. 

09. අඹ ගෙඩියක මිල රුපියල් 25 කි. දොඩම් ගෙඩියක මිල රුපියල් 40 කි. අඹ ගෙඩියක සහ දොඩම් දෙවර්ගයෙන්ම කිසියම් ගෙඩි සංඛ්‍යාවක් මිලදී ගැනීමේ දී රුපියල් 170 ක් වැය වූයේ නම් මිල දී ගැනීමට හැකි වූ දොඩම් ගෙඩි ගණන කීය ද?

1. 2     2. 3     3. 4

10. තරඟයකින් ජයග්‍රහණය කළ කණ්ඩායමක සාමාජිකයන් ගණන 4 කි. ආරාධිත අමුත්තා ඔවුන් සියල්ලට ම සුභ පතමින් අතට අත දෙන ලදී. ඔවුහු සියලු දෙනාම එකිනෙකාට අතට අත දී සුබ පැතුහ.මෙහි දී සිදු වූ අතට අත දීම් වාර ගණන කීය ද?

1. 15     2. 11     3. 10

11. පහත දී ඇති රූප සටහන් දෙකට අනුව A ප්‍රමාණයේ කාඩ්බෝඩ් කැබැල්ලකින් B ප්‍රමාණයේ වෘත්ත කීයක් කැපිය හැකි ද?




1. 28
2. 30
3. 36

12. රූපයේ දැකිය හැකි සෘජුකෝණාස්‍ර ගණන කීය ද?



1. හතරකි
2. හතකි
3. නවයකි

13. පන්ති කාමරයක සිටි ගැහැනු ළමයින් සංඛ්‍යාව එහි සිටි පිරිමි ළමයි සංඛ්‍යාව මෙන් දෙගුණයකි. එම පන්ති කාමරයේ සිටි ගැහැනු ළමයි සංඛ්‍යාවෙත් පිරිමි ළමයි සංඛ්‍යාවේත් එකතුව කීය ද?

1. 32 2. 35 3. 36

14.




මෙම කාඩ්පත් හතරේ ඇති රෝම සංඛ්‍යාංක ආරෝහණ පටිපාටියට සකස් කළ විට පිහිටන අනුපිළිවෙළ කුමක් ද?

1. □ △ # ○ 2. △ □ # ○ 3. ○ # △ □

15. වට්ටියක නිල් මල් 7, රතුමල් 5 සහ කහමල් 6 කි. වට්ටිය දෙස නොබලා රතු මලක් ගැනීමට වට්ටියෙන් ඉවතට ගත යුතු මල් ගණන කීය ද?

1. 13 2. 14 3. 15

16. නිෂානි පළමු දිනයේ වෙරළු ගෙඩි 8 ක් අහුලයි. ඉන් පසු ඇය සෑම දිනකදීම පෙර දිනයේ ඇහිලු වෙරළු ගෙඩිවලට වඩා ගෙඩි 5 ක් වැඩියෙන් අහුලයි. ඇය දින 7 කි දී අහුලන ලද වෙරළු ගෙඩි ගණන කීය ද?

1. 152 2. 160 3. 161

17. අංක පිළිවෙළින් ඇති රුපියල් 500.00 නෝට්ටු මිටියක පළමු අංකය 40485 හා අවසාන අංකය 40505 ලෙස සටහන්ව තිබුණි. එහි මුදල්වල වටිනාකම අයත් පිළිතුර තෝරන්න.

1. රුපියල් 10,000.00 2. රුපියල් 10,500.00 3. රුපියල් 9,500.00

18. පහත රූපයේ අඳුරු කර ඇති කොටස් දැක්වෙන භාගය නොවන්නේ,



1. $\frac{1}{2}$ 2. $\frac{4}{8}$ 3. $\frac{3}{8}$

19. පහත රූපයේ දැක්වෙන මල කැපීමට සමචතුරස්‍රාකාර කඩදාසියක් නැවිය යුතු වාර ගණන නිවැරදිව දැක්වෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.



1. 2
2. 3
3. 4

20. වලාකුළින් බිමට වැටෙන - ටක් ටික් ටුක් හඬක් නැගෙන

පුංචි අපට සිසිල ගෙනෙන - තරහ ගියොත් නපුරෙක් වෙන

මෙම කවියේ අදහස වඩාත් හොඳින් ගැළපිය හැක්කේ,

1. සුළඟට 2. සෙවණට 3. වැස්සට

21. මීටර 4 සෙන්ටිමීටර 80 ක් දිග කම්බියක් හරි මැදින් දෙකට කපා එක් කැබැල්ලකින් සමචතුරස්‍රයක් සාදන ලදී. එහි පැත්තක දිග කීය ද?

1. සෙන්ටිමීටර 60 2. සෙන්ටිමීටර 50 3. සෙන්ටිමීටර 120

22.



ඔබ සතුව ඉහත ආකාරයේ කුඩා ඝනක 38 ක් පමණක් තිබේ නම් එම ඝනක එකතු කර විශාල ඝනකයක් සෑදීමට ඉවත් කළ යුතු ඝනක ගණන කීය ද?

1. 13 2. 12 3. 11

23. පළමු රූපයේ අඳුරු කර ඇති කොටු වැසෙන සේ දෙවන රූපය ඇලවුවහොත් එයට ලැබෙන සමචතුරස්‍ර කොටු දැලෙහි ඇති මුළු කොටු සංඛ්‍යාව කීය ද?



පළමු රූපය



දෙවන රූපය

1. 25 2. 28 3. 30

24. ඊයේ බදාදා සුමුදුගේ උපන්දිනය පැවැත්වූයේ ය. පෙරේදා 8 වෙනිදා ය. අද දිනය හා දවස කවදා ද?

1. 10 අඟහරුවාදා 2. 10 බ්‍රහස්පතින්දා 3. 9 බ්‍රහස්පතින්දා

25. අංක **01** , **02** ආදී වශයෙන් 1 සිට 100 තෙක් සංඛ්‍යා ලිවීමේ දී 0 ඉලක්කම යෙදෙන වාර ගනන කීය ද?

1. 19 2. 20 3. 21

26. පැයකට 80km ක වේගයෙන් ගමන් කරන බසයක් 200km ක් යාමට ගත වන කාලය කොපමණ ද?

1. පැය 2 මිනිත්තු 30 2. මිනිත්තු 30 3. පැය 1 මිනිත්තු 40

27. දී ඇති රූප දෙක විනිවිද පෙනෙන කඩදාසි දෙකක ඇඳ ඇත.



1 රූපය



2 රූපය

රූප දෙකෙහි ම A සලකුණු එකමත එක පිහිටන සේ එක් කඩදාසියක් මත අනෙක තැබූ විට ලැබෙන රූපය කුමක් ද?

1. 
2. 
3. 

28. රටාව හඳුනාගෙන පිළිතුර සොයන්න.

○ × □ = △ □ + □ = ○ ○ × ○ = 36

△ හි අගය කීය ද?

1. 14 2. 18 3. 20

29. ○ + □ + △ = ? හි අගය කීය ද?

1. 27 2. 25 3. 26

30. එක්තරා මාර්ගයක ගමන් කරන විට රුවන්ගේ නිවසට පසුව කමල්, සුනිල් සහ සමන් යන යාළුවන්ගේ නිවෙස් හමු වේ. ඔවුන්ගේ එකිනෙකාගේ නිවෙස් අතර දුර කිලෝමීටර වලින් වගුවෙහි දැක්වේ.




රුවන්ගේ නිවසේ සිට සමන්ගේ නිවසට ඇති දුර කිලෝමීටර කීය ද?

1. 16km 2. 10km 3. 12km

31. මුළු රූපයේ වටේ දිග අඳුරු කර ඇති කොටසේ වටේ දිග මෙන් කී ගුණයක් ද?



1. හතර ගුණයකි
2. තුන් ගුණයකි
3. පස් ගුණයකි

32. පහත දී ඇති සංඛ්‍යාවල රටාවක් ඇතිවීම සඳහා ඉවත් කළ යුතු සංඛ්‍යා මොනවා ද?

(1) (4) (8) (9) (16) (20) (25)

1. 9 සහ 16    2. 20 සහ 25    3. 8 සහ 20

33. 12cm ක් දිග ලී පටි 6 ක් එකමත එක 2cm බැගින් තබා ඇණ ගසා දිග ලී පටියක් සාදන ලදී. සෑදූ ලී පටියේ දිග කොපමණ ද?

1. 62cm    2. 52cm    3. 72cm

34. පහත රටාව ඉරටු ඇසුරින් නිර්මාණය වී ඇත. ඒ අනුව 7 වෙනි අවස්ථාව සෑදීමට අවශ්‍ය ඉරටු කැබලි ගණන කීය ද?



1 අවස්ථාව    2 අවස්ථාව    3 අවස්ථාව    4 අවස්ථාව

1. 28    2. 22    3. 23

35. රූපයේ දැක්වෙන පරිදි දෙකෙළවර නැවත එකතුවන සේ කම්බියක් නැවීමෙන් ලබා ගත හැකි හැඩය වන්නේ,




1. 

2. 

3. 

36. මීටර 200 දිවීමේ තරගයක් පිළිබඳව A , B , C යනුවෙන් ප්‍රකාශ 3 ක් පහත දී ඇත.

A - කුමාරිට පෙර නයනා තරගය නිම කළේ ය.

B - තරගකරුවන් හය දෙනෙකු තරගය නිම කළේ කුමාරිට පසුව ය.

C - තරගකරුවන් 8 දෙනෙක් තරගයට සහභාගි වූහ.

තරගයේ පළමු වැන්නා කවුරුන්දැයි නිගමනය කිරීමට අවශ්‍ය ප්‍රකාශ මොනවා ද?

1. A හා B පමණි    2. A හා C පමණි    3. A,B හා C තුනම

- **රූපයේ දැක්වෙන්නේ පාපැදිකරුවෙකු ආරම්භක ස්ථානයෙන් ගමන් අරඹා නැවත එම ස්ථානයට පැමිණි මාර්ගයයි. ඒ ඇසුරින් 37 හා 38 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




37. ආරම්භක ස්ථානයට පාපැදිකරු නැවත පැමිණෙන විට දකුණු පසට හා වම් පසට හැරුණු වාර ගණන කීය ද?

 1. දකුණු පසට 1 වම් පසට 5 යි
 2. දකුණු පසට 4 වම් පසට 1 යි
 3. දකුණු පසට 5 වම් පසට 1 යි

38. නැවත ආරම්භක ස්ථානයට පැමිණෙන විට පාපැදිකරු ගමන් කර ඇති මුළු දුර කිලෝමීටර කීය ද?

 1. 26 km  2. 28 km  3. 30 km

39. තේ හැන්දකට අල්ලන දියර ප්‍රමාණය 5*ml* කි. වරකට තේ හැඳි දෙක බැගින් දිනකට තුන්වරක් බෙහෙත් දෙන රෝගියෙකුට දින 5 කට අවශ්‍ය ප්‍රමාණය කොපමණ ද?

 1. 150 *ml*  2. 130 *ml*  3. 160 *ml*

40. පාසලක සිටින සිසුන් 48 දෙනෙකුගෙන් 25 දෙනෙකු චිත්‍රවලට කැමති අතර 38 දෙනෙකු සංගීතයට කැමති ය. ඒ අනුව විෂයන් දෙකට ම කැමති සිසුන් ගණන කීය ද?

 1. 15  2. 18  3. 19